අඹන්ගහකෝරළේ ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 12 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට අඹන්ගහකෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මැටිහක්ක බහුකාර්යය ගොඩනැගිල්ලේ වටිනාකම රු.39,188,670 ක් හා එහි උපකරණ හා උපාංග 308 ක වටිනාකම ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ආ) සභාව සතු ජේසර්වත්ත ප්‍රජාශාලා ගොඩනැගිල්ලේ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) කාර්යාල උපකරණ ගිණුම රු.30,632 ක් වැඩියෙන් දැක්වුණි.

(ඈ) පරිත්‍යාග ලෙස ලැබී තිබූ කසල කරත්තයක වටිනාකම සහ අංක JB – 2773 ට්‍රැක්ටරයට අයත් ට්‍රේලරයේ වටිනාකම වූ රු.125,000 ක් ද ගිණුම්ගතකර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 7 ක වටිනාකම රු.10,374,426 ක් වූ අතර, වර්ෂ 3කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකළ රු.1,425,441 ක ශේෂ ඊට ඇතුළත්ව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් ශේෂ 8 ක වටිනාකම රු.7,894,048 ක් වූ අතර, වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින රු.1,748,297 ක් වූ ශේෂ ඊට ඇතුළත්ව තිබුණි.

(ii) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට යැවිය යුතු වසර 7කට වැඩි කාලයක සිට පැවත එන රු.626,974ක ශේෂයක් පැවතුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

---------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 7 කට අදාල එකතුව රු. 8,146,624 ක්වූ ශේෂ සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

------------------------------------------------------

නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988, ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) 2015 මාර්තු 10 දිනැති අංක 03/2014 (i) දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයේ කාණ්ඩ අංක vi සහ මධ්‍යම පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ අංක 3/2/1/23 හා 2015 අගෝස්තු 26 දිනැති ලිපිය | අනුමත රු.2,000 ක මුදල ඉක්මවා වියදම් දරා ඇති දුරකථන බිල්පත් ඉදිරිපත් කිරීමෙන් පසු රු.4,000 දක්වා බිල්පත් ප්‍රතිපූර්ණය කළයුතු වුවද, එවැනි බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමකින් තොරව, 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.4,000 ක දීමනාවක් සභා ලේකම්ගේ වැටුපට එකතුකර ගෙවීම්කර තිබීම හේතුවෙන් 2016 වර්ෂය තුලදී රු.24,000ක මුදලක් උපදෙස්වලට පටහැනිව වැඩිපුර ගෙවීම්කර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.990,615 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.532,059 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.458,556 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.458,556ක වර්ධනය සඳහා ආදායම් විෂයයන් 5ක රු.961,819කින් ආදායම් වැඩිවීම හා වියදම් විෂයයන් 2ක රු.541,200 කින් වියදම් අඩුවීම බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

3.3.1 බදු කුලී

---------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බදු දී තිබුණු කඩකාමර වෙනුවෙන් රු.23,430 ක ශේෂයක් අයවීමට තිබුණි.

2.3.2 වෙනත් ආදායම්

------------------

(අ) ජල ගාස්තු

--------------

සභාව සතු ජල යෝජනා ක්‍රම 7 හි 2016 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු ආදායම රු.338,704 ක් වූ අතර, ඒ තුළ ජල පාරිභෝගිකයින් 22 දෙනෙකුගෙන් 2013 වර්ෂයේ සිට අයවිය යුතුව පවතින රු.31,475 ක ශේෂයක්ද විය.

(ආ) අක්කර බදු

-------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.58,549 ක හිඟ ශේෂයක් පැවතුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.40,000 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,290,000 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

-------------------

ප්‍රදේශයේ පොදු පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ව්‍යාපෘති 6 ක් වර්ෂ ගණනාවක සිට ක්‍රියාත්මකකර නොතිබුණු අතර, 2016 සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කළයුතු බවට හඳුනාගෙන තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.19,500,000ක සංවර්ධන ව්‍යාපෘති 16 ක්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සමීක්ෂණ මණ්ඩලයක් මඟින් තහවුරුකර ගැනීමකින් සහ නිසි අනුමැතියක් ලබා ගැනීමකින් තොරව රු.144,000ක්වූ ගොඩනැගිලි දෙකක වටිනාකම ගිණුම්වලින් ඉවත්කර තිබුණි.

(ආ) අනුමත තනතුරු 9 කට අදාළව පුරප්පාඩු 16 ක් පැවතුණි.

(ඇ) පොදු ළිං 51 කට හා සුසාන භූමි 13 කට අදාළව හිමිකම් ඔප්පු සහ ඉඩම් 4 කට හා ගොඩනැගිලි 8 කට අදාලව මිනින්දෝරු සැලසුම් නොතිබුණු අතර, ලෝලුවල ගම්සභා

කාර්යාල ඉඩම සහ ඇහැලගස්තැන්න ප්‍රජා ශාලාව පිහිටි ඉඩම වැට මායිම් යොදා ආරක්ෂා කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාව විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පවතින වාහන 4ක හිමිකම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2009 හා 2013 වර්ෂවල සිට පැවත එන රු.111,833 ක් වටිනා තැන්පත් ශේෂ 11 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අනුමත කාර්ය මණ්ඩලයේ මුරකරු තනතුරක් දිගු කාලීනව පුරප්පාඩුව පැවතියද එම පුරප්පාඩුව පිරවීම සඳහා කටයුතු නොකර මැටිහක්ක බහු කාර්ය ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා දෛනික වැටුප් ගෙවීම් පදනමට මුරකරුවෙකු සේවයේ යොදවාගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.283,018 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මහජන සෞඛ්‍ය පරීක්ෂක හා පරිසර නිලධාරි නිර්දේශ ලබානොගෙන අවදානම් සහිත ව්‍යාපාර 20 ක් සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි.

(ආ) අනවසර ඉදිකිරීම් ලේඛනය අනුව 2012 වර්ෂයේදී හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 5ක් සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 13 කින් 6 ක් සඳහා අනුමැතිය ලබාදී තිබූ නමුත්, අනුකූලතා සහතික නිකුත්කර නොතිබුණි.

(ඈ) හානි පාඩු ලේඛනය සහ පරිගණක හා උපාංග සඳහා ලේඛනය පවත්වා නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

සභාව සතු වාහන 6 ක් වර්ෂ 1 සිට වර්ෂ 8 දක්වා කාලයක් නිෂ්ක්‍රීයව පැවැති අතර, ගොඩනැගිලි 2 ක් වර්ෂ කිහිපයක සිට පරිහරණය නොකර නිෂ්කාර්යව පැවතුණි.

3.5 හඳුනාගත් අලාභ

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව තනතුරු 3 ක් සඳහා ස්ථිර පත්වීම් 4 ක් ප්‍රදානයකර පසුව අවලංගු කිරීම හේතුවෙන් එම නිලධාරීන් විසින් 2016 සැප්තැම්බර් 25 දිනැතිව සභාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකර තිබූ නඩුවට අදාලව සමාලෝචිත වර්ෂයේ දී දරා තිබූ රු.300,000ක නඩු ගාස්තු නිසි උපදෙස් ලබා ගැනීමකින් තොරව හා චක්‍රලේඛවලට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් සභාවට අලාභයක් සිදුකර තිබුණි.

(ආ) අංක 252 – 6519 දරන ඩබල් කැබ් රථයේ අයිතිය පවරා නොගැනීම හේතුවෙන් වර්ෂ18 කට අදාල හිඟ ආදායම් බලපත්‍ර ගාස්තුව ගෙවීමේදී සේවා ගාස්තු හා දඩ මුදල් වශයෙන් දැරීමට සිදුවී තිබූ රු.47,970 ක අතිරේක වියදම සභා අරමුදලට පාඩුවක් වී තිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

කළුගහ ආශ්‍රිතව ළිඳක් ඉදිකර ජල ව්‍යාපෘතිය සඳහා ජලය ලබාදීම.

------------------------------------------------------------------------

ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ රු.1,685,451 ක වියදමක් දරා ඉදිකර තිබූ ළිඳ හා පොම්පාගාරය පිහිටි භූමියේ හිමිකම ප්‍රාදේශීය සභාව හෝ ප්‍රජා ජල සමිතියකට පවරාගෙන නොතිබුණු අතර, ව්‍යාපෘතිය සඳහා විදුලි සැපයුම් නොතිබීම හා ජල පොම්ප සපයා සවි නොකිරීම මත ජල සැපයීමේ කටයුතු 2017 මාර්තු 13 දින වන විටද ආරම්භ කර නොතිබුණි.

3.7 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

-----------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළ ඉටු කිරීමට යෝජිතව තිබූ ප්‍රතිපාදිත මුදල රු.1,850,000ක් වූ ව්‍යාපෘති 4 ක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 5(7) ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

4.3 අයවැය පාලනය

--------------------

(අ) ආදායම් විෂයයන් 11කට අදාළ රු.170,000 ක් වූ ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් උපයා නොතිබුණු අතර, ආදායම් විෂයයන් 24ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය ආදායම අතර, විචලනයේ ප්‍රතිශතය සියයට 28 සිට සියයට 305 ක් අතර පරාසයක පැවතුණි.

(ආ) වියදම් විෂයයන් 15 කට අදාළ රු.390,000 කින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඉතිරිකර තිබූ අතර, විෂයයන් 28 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර විචලනයේ ප්‍රතිශතය සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ආදායම් හා වියදම් විෂයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද, අයවැය ගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනය

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය

(අ) ණයගැති හා ණයහිමි පාලනය.

(ආ) කාර්ය මණ්ඩල කළමනාකරණය.

(ඇ) වත්කම් කළමනාකරණය.

(ඈ) අයවැය පාලනය.